**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - 2013**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දරන ලද උපදේශන ගාස්තු රු.360,000 ක් අදාල වත්කම ප්‍රාග්ධනීත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සේවක පාරිතෝෂිකය වෙනුවෙන් රු.69,962 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ) භෞතික තොග සත්‍යාපනයකින් තොරව තොගයේ පොත් ශේෂය මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල විකුණන ලද රු. 43,904 ක් වූ ප්‍රකාශන තොගය සඳහා ගැලපුම් කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් ශේෂය රු. 193,593 ක් වුවද පරිත්‍යාග ලෙස ලැබූ රු.131,953 ක පොත් හා විදේශිය මූල්‍ය වටිනාකමින් දක්වා තිබූ $.220.80 ක හා £.201.25 ක වටිනා පොත් ගිණුම් වලින් අත්හැරී තිබුණි.මෙයට අතිරේකව පොත් 1286 ක වටිනාකමද ගණනය කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුළ රු.3,236,930 ක ලැබීම් වලට අදාල ලදුපත් විගනණයට ඉදිරිපත් නොවූ අතර බැංකුවට කෙලින්ම ප්‍රේෂණය කරන ලද සම්මන්ත්‍රණයක් සඳහා ලැබීම් හා සේවක ණය නිරවුල් කිරීමෙන් ලද රු.1,132,797 ක මුදල් වෙනුවෙන් ලදුපත් නිකුත් කර නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 11.1.5 වගන්තිය | එක්වරක් පමණක් ගෙවිය හැකි දේපළ ණය, ආයතනයේ උපදේශකවරයෙකුට 2005 වර්ෂයේදී රු.700,000 ක් ගෙවා තිබියදී 2012 වර්ෂයේදී නැවත රු. 500,000 ක් ගෙවීම් කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 371 (ආ) | අවස්ථා 25 කදී ලබාදුන් රු.434,638 ක් වූ අත්තිකාරම් පියවීමට දින 30 සිට දින 168 දක්වා කාල පරාසයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය.අත්තිකාරම් ලබාදීමට ප්‍රථම කාර්ය හඳුනාගෙන වියදම් ඇස්තමේන්තුවක් සකස්කර එය අනුමත කරවාගෙන නොතිබුණි. කිසිඳු සැලැස්මකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් වියදම් කළ මුදලින් අඩකට වඩා හෝ ඊට ආසන්න ප්‍රමාණයක් ඉතිරි කර පියවා තිබූ අවස්ථා 69 ක් නිරීක්ෂණය විය. තවද, ලබාදුන් අත්තිකාරම පියවීමට ප්‍රථම නැවත අත්තිකාරම් ලබාදුන් අවස්ථාද නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 751,756, හා 757 | එක් එක් අංශවල ඉන්වෙන්ට්‍රි ලේඛණ පවත්වා නොතිබුණු අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 264 (1) | ගෙවීම් වවුචර් 36 කට අදාළ රු. 2,869,924 ක ගෙවීම් මුදල් ආදායකයා ලබාගත් බවට තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය. |
| (iv) මුදල් රෙගුලාසි 1645(අ) ,1647(අ) | රෙගුලාසි ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2010 ඔක්තෝම්බර් 11 දිනැති අංක 01/2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 (III) ඡේදය | නිලධාරියකු අධ්‍යයන හෝ පුහුණුව සඳහා විදේශගත වන අවස්ථාවක දී එක් දිනකට ඇ.ඩොලර් 30 බැගින් ගෙවිය යුතු බව සඳහන් කර තිබුනද ආයතනයේ නිලධාරින් දෙදෙනෙකු විදේශීය පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණවලට සහභාගි වීම වෙනුවෙන් දිනකට ඇ.ඩොලර් 50 බැගින් ගෙවීම හේතුවෙන් දින 14 ½ ක් සඳහා රු. 37,733 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |
| (ඈ) 2013 ඔක්තෝම්බර් 07 දිනැති අංක 21/2013 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i).රජයේ නිවාඩු දිනයක වැඩ කිරීම නියම කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු හෝ අතිකාල දීමනා ලැබීමට හිමිකම් නොමැති නිලධාරියෙකු ලිත් මාසයකට උපරිම දින 2 ක් සඳහා ආයතන ප්‍රධානියාගේ පූර්ව අවසරයද, දින දෙකකට වැඩි ගණනක් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් නිලධාරින් 17 දෙනෙකුට දින 42 ක් සඳහා අනුමැතියකින් තොරව රු. 60,561 ක් ගෙවා තිබුණි.<br><br>(ii).2013 සැප්තැම්බර් 19 සිට ඔක්තෝම්බර් 08 දක්වා මාණ්ඩලික නොවන නිලධාරින් 10 දෙනෙකු වෙනුවෙන් දින 35 ක් සඳහා 1/20 දීමනා වශයෙන් රු.16,256 ක් ගෙවා තිබුණි.<br><br>(iii).ඉහත සඳහන් නිලධාරින් පැය අටක් වැඩ කළ බවට පැමිණීම පිටවීම සනාථ කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2005 මාර්තු 31 දිනැති අංක 08/ 2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | 2005 ජනවාරි 01 දින සිට බැංකු මඟින් දේපල ණය ලබාදීම ක්‍රියාත්මක කරන ලදී. එහෙත් මෙම චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් 10 දෙනෙක් සඳහා වෙනත් අදායම් ගිණුම් වලින් රු. 8,433,200 ක දේපල ණය ආයතනයෙන් ලබා දී තිබුණි. |
| (ඊ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2013 ජනවාරි 31 දිනැති අංක 157(1) දරන ජාතික අයවැය චක්‍රලේඛය. | ආපදා ණය ලබාදීමේදී උපරිම ණය සීමාව මාස 10 ක මූලික වැටුප හෝ රු.250,000 යන දෙකෙන් අඩු අගය සැළකිය යුතු වුවත් නිලධාරීන් තිදෙනකුට රු.293,000 සිට රු. 435,000 දක්වා පරාසයක ආපදා ණය ලබා දී තිබුණි. එම සීමාවන් ඉක්මවා ලබාගත් ණය ආපසු අයකර ගැනීමට ජාතික අයවැය චක්‍රලේඛය අනුව නියම කළ ද අයකර ගැනීම් කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). ආයතන සංග්‍රහය හා චක්‍රලේඛවලට අනුකූල නොවන ලෙස නිලධාරීන්ට ලබාදුන් සේවක ණය ගෙවීම්, මූල්‍ය ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 13,622,846 ක් වූ අතර ඒ තුළ 2010 වර්ෂයේ සිට පැවතෙන මියගිය හා සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 777,722 ක් සහ 2011 වර්ෂයේ සිට පැවත එන රු. 30,707 ක් වූ වෙනත් සේවක ණය ද අයකර ගැනීම සඳහා ආයතනය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ). නිලධාරියෙකු ඉල්ලුම් කරන ලද ණය රු.1,447,800 ක දේපල ණය මුදලට වඩා රු. 100,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ). භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව වැටුපට අමතරව දීමනා ලබා ගැනීමේ දී අමාත්‍ය මණ්ඩලය හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිලාභ පමණක් ගෙවිය හැකි වුවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පහත සඳහන් දීමනා ගෙවා තිබුණි.

(i). සමාලෝචිත වර්ෂයේදී ද දිරි දීමනාවක් ලෙස එක් නිලධාරියෙකුට රු.10, 000 බැගින් අධ්‍යක්ෂක ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා රු.286, 257ක් ගෙවා තිබුණි.

(ii). දීමනා ගෙවීම් වෙනුවෙන් ආයතනය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව සම්පත් දායක දීමනා, සම්බන්ධීකරණ දීමනා, ලිපිකරු දීමනා හා කාර්යාල සහයක දීමනා වශයෙන් නිලධාරීන් 05 දෙනෙකුට එකතුව රු. 438,800 ක් හා විශේෂ පුහුණු වැඩමුළුවක් වෙනුවෙන් ව්‍යාපෘති දායකත්ව දීමනා අධ්‍යක්ෂක ඇතුළු කාර්ය මණ්ඩලයට රු.1,000 බැගින් සමාලෝචිත වර්ෂයේදී රු.31,000 ක්ද ගෙවා තිබුණි

(iii). කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව ව්‍යාපෘති වලින් පවරනු ලබන වැඩ කොටස් කිරීම වෙනුවෙන් දීමනා ලබා ගැනීමට අමතරව වැටුපෙන් 1/3 ක දීමනාවක් 2013 ජනවාරි මාසය සඳහා නිලධාරීන් තිදෙනෙකුට රු. 38,155 ගෙවා තිබුණි.

(ඈ). 2000 පෙබරවාරි 21 හා 2013 ජනවාරි 11 දිනයන්හි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරක් වන මාධ්‍ය උපදේශකවරයෙකු හට මාසිකව රු. 40,000 ක් බැගින් රු. 480,000 ක වාර්ෂික වැටුපක් ගෙවා තිබුණි. එම නිලධාරියාගේ වැටුපෙන් 2011 දෙසැම්බර් සිට 2013 දෙසැම්බර් 31 දක්වා වැන්දඹු අනන්දරු හා අග්‍රහාර අඩුකර එම අඩු කිරීම් අදාළ දෙපාර්තමේන්තුවට යැවිය යුතු වුවත් වැන්දඹු අනත්දරු රු. 118,400 ක් හා අග්‍රහාර රු. 2,775 ක් උපචිත වියදම් ගිණුමේ රඳවා තිබුණි. මෙම නිලධාරියාගේ පැමිණීම හා පිටවීම පිළිබඳව කිසිදු ලිඛිත සාක්ෂියකින් සනාථකර නොතිබුණු අතර පූර්ව අනුමැතියකින් තොරව වර්ෂයේ සෑම මාසයකම දින 5 ක් සඳහා නිවාඩු දින දීමනා රු. 10,000 බැගින් එකතුව රු.120,000 ක් ගෙවා තිබුණි.

**2.5 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

වාහන 05 ක ධාවන සටහන්, ගෙවීම් වවුචර හා ඉන්ධන ඇණවුම් ලේඛන පරීක්ෂාවේ දී රු. 286,598 ක් වූ ලබාගත් ඉන්ධන ධාවන සටහන්වල සටහන් නොවී ඇණවුම් පත්‍රිකාවල හා ගෙවීම් වවුචර්වල පමණක් සටහන් වී තිබුණි. ඉන්ධන ඇණවුම් අනු පිටපතේ වාහනයට යෙදූ ඩීසල් ප්‍රමාණය සටහන් කර නොතිබුණු අතර එම ඇණවුම් සඳහා ගෙවීම් කිරීමේ දී ධාවන සටහන් හි වාහනයට යෙදූ ඉන්ධන සටහන්ව ඇති බව ද තහවුරු කර නොතිබුණි.

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,575,023 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,467,357 ක ඌනතාවයක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,107,666 ක පිරිහීමක් විය. මෙම පිරිහීම සඳහා වෙනත් ආදායම් සියයට 37 කින් එනම් රු. 5,615,683 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම සියයට 10 කින් එනම් රු. 5,451,583 කින් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පළාත් සභා හා පලාත් පාලන ආයතනවල සභිකයින්, නිලධාරින් හා සේවකයින්ට ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි වැඩමුළු හා පුහුණු පාඨමාලා පැවැත්වීම අංශ 8 ක් සඳහා වාර්ෂික අයවැය මඟින් රු. 18,000,000 ක මුදලක් වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මේ සඳහා රු. 18,075,295 ක් වැය කර තිබුණ ද, ආයතනය සැලසුම් කළ කාර්යසාධනය සිදු වී නොතිබුණු බව එක් එක් අංශ වාර්තා අනුව නිරීක්ෂණය විය.

(i). ඉංජිනේරු අංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වැඩ සටහන් 29 ක් සැලසුම් කර තිබුණ ද වැඩ සටහන් 21 ක් පමණක් පවත්වා තිබුණු අතර එහි මූල්‍ය කාර්යසාධනය සියයට 66 ක් විය. සැලසුම් කරන ලද වැඩ සටහන් 04 පවත්වා නොතිබුණු අතර රු. 500,000 ක් වෙන්කර තිබු පළාත් සභා මට්ටමේ පුහුණු වැඩසටහන් 05 ක් ද පවත්වා නොතිබුණි.

(ii). පොදු කළමනාකරණ අංශයේ ප්‍රතිපාදන මුදලට වඩා රු. 712,545 ක මුදලක් වැඩිපුර වැයකර සැලසුම් කරන ලද වැඩ සටහන් 25 න් 15 ක් පමණක් පවත්වා තිබුණි. මෙම අංශය කාණ්ඩ 04 ක් යටතේ සැලසුම් කළ වැඩ සටහනක් සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතනවල

සභිකයින් ද සහභාගී කර ගැනීමට සැළසුම් කර තිබුණ ද එක් වැඩ සටහනකට හෝ සභිකයින් සහභාගි කරවා ගෙන නොතිබුණි. රු. 500,000 ක් වෙන්කර තිබූ පළාත් මට්ටමේ වැඩ සටහන් පවත්වා නොතිබුණි.

(iii). මූල්‍ය කළමනාකරණ අංශය

- වෙන් කරන ලද ප්‍රතිපාදනය රු.2,500,000 ක් වුවද රු. 3,338,530 ක වියදම දරා තිබුණි. එම වියදම් පරීක්ෂාවේ දී මුදල් අයකර පවත්වනු ලබන පළාත් පාලන මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා වියදම වූ රු.1,661,540 ක් හා ආයතනයෙන් මුදල් අයකර පවත්වන ලද උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ මූල්‍ය කළමනාකරණ අංශයට අයත් කොටස සඳහා දින 04 ක් වැඩ සටහන් පවත්වා ඒ සඳහා වැය වූ රු. 77,723 ක මුදලද මෙම අංශයේ වියදමට එකතු කර තිබුණි.

- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කළමනාකරණ අංශයට වෙන් කළ ප්‍රතිපාදනවලින් සියයට 70 ක් අරමුණට අදාලව ප්‍රයෝජනයට ගෙන නොතිබූ බැවින් පළාත් පාලන ආයතනවල මූල්‍ය හා අනෙකුත් කළමනාකරණ කටයුතු සංවර්ධනය හා කාර්යක්ෂම කිරීමේ පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම දූර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය කෙරේ.

- ක්‍රියාකාරී සැලැස්මට අනුව මුදල් අයකර පවත්වන ඩිප්ලෝමා පාඨමාලාව දින 24 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණත් එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට දින 58 ක් ගෙන තිබුණි. එය ඇතුළත් විය යුත්තේ එක් පාඨමාලාවක් ලෙස බව විගණනයේදී අවධාරණය කෙරේ.

(iv) නීති අංශයේ සැලසුම් කරන ලද වැඩ සටහන් 34 න් 20 ක් පමණක් පවත්වා තිබුණු අතර වෙන්කරන ලද රු. 2,500,000 ක මුදල ඉක්මවා රු. 308,297 ක් ද වියදම් කර තිබුණි.

(v) පර්යේෂණ ප්‍රකාශන හා පුස්තකාල අංශයේ වැඩ සටහන් 11 කට රු. 2,500,000 ක් වැය කිරිමට සැලසුම් කර තිබියදී වැඩසටහන් 05 ක් පැවැත්වීමට රු. 2,561,985 ක් වැයකර තිබුණි. පළාත් මට්ටමින් පුහුණු වැඩ සටහන් සඳහා රු. 200,000 ක ප්‍රතිපාදනයක් තිබුණු නමුත් ඒ සම්බන්ධ ප්‍රගතියක් විගණනයට ඉදිරිපත් නොවිය. මෙම අංශයේ ගාස්තු අයකර කරනු ලබන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා ද වියදම් කරන ලද රු. 425,000 ක මුදල ද මෙම අංශයේ වියදමට ඇතුළත් කර තිබුණි.

(vi). මූල්‍ය ප්‍රකාශන වල පුහුණු වැඩ සටහන් වියදම හා එක් එක් අංශවල ප්‍රගති වාර්තා අතර රු.2,734,649 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). ආයතනයේ අංශ භාර නිලධාරින් විසින් සකස්කළ යුතු සංයුක්ත සැලැස්ම සැකසීම සඳහා ආයතනයේ ඉංජිනේරු උපදේශක හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය විසින් රු. 100,000 ක මුදලක් ලබා ගෙන තිබුණි.

(ආ). වර්ෂයේ ප්‍රකාශන විකුණුම් ආදායම රු. 43,904 ක් විය.එය තොග වටිනාකමින් සියයට 2.8 වැනි සුළු විකුණුම් වටිනාකමක් වීමෙන් ප්‍රකාශන විකුණුම් ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවිය.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ 2013 නොවැම්බර් 28 දින එළඹි ගිවිසුම අනුව දින 300 ක් වන කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය 2014 සැප්තැම්බර් 30 දින අවසන් වී දින 60 ක් ගතවී තිබුණද, ගොඩනැගිල්ලේ අත්තිවාරම පමණක් නිමකර තිබුණි.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

ලිපි ද්‍රව්‍ය හා ප්‍රකාශන තොග ආරක්ෂිතව ගබඩා නොකිරීම හේතුවෙන් රු. 35,196 ක් වූ ලිපි ද්‍රව්‍ය තොග විනාශ වී තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 48 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 31 ක් වීමෙන් පුරප්පාඩු 17 ක් විය. පුරප්පාඩු පිරවීමට කළමනාකරණය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු බව සඳහන් වුවද, ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2013 සැප්තැම්බර් 17 දිනය. එනම් මාස 07 ක් ප්‍රමාද විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

(අ) 2014 මාර්තු 05 දින පවත්වන ලද රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ තීරණය අනුව 2011 වර්ෂය හා ඊට පසු ගෙවන ලද ප්‍රසාද දීමනා සඳහා ආවරණ අනුමැතිය භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු බව දක්වා ඇතත් 2014 නොවැම්බර් මස වන විටත් එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සකස් කිරීම සඳහා පළාත් පාලන ආයතනවල සේවකයන් පුහුණු කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට 2014 මාර්තු 05 පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව කාරක සභාවෙන් නියෝගයක් ලබාදී ඇතත්, 2014 ඔක්තෝම්බර් 30 වන විටද පිළිගත් වැඩසටහනක් සකස් කර අමාත්‍යාංශයේ ඇමතිවරයා විසින් පාර්ලිමේන්තුවේ එකඟතාවය මත ගැසට් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වරින්වර වාර්තා කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් කලමනාකරණය
(ආ) සේවක ණය
(ඇ) වැඩමුළු පැවත්වීම හා දීමනා ගෙවීම
(ඈ) වාහන පාලනය